


SERENDIB lanka Travels
Gateway to Serendipity

COLOMBO From £305 + TAX
INDIA From £345 + TAX
FAR EAST From £385 + TAX

WOW Unbeatable Offer
Sea Freight From £10 a Tea Chest

1 Olympic way, Wembley HA9 0NP
Tele: 020 8782 1140 - Fax: 020 8782 1134
email: info@serendib-lanka.co.uk


## Sri Lanka Air Force Women Paratroopers

## අපේ ගුවන් හමුදාවේ පැරචුට් සෙබළියෝ



One of seven female Paratroopers of the **Sri Lanka Air Force** glides in the sky during a passing out parade of the Basic Airborne course held last month at the **Katunayake Air Force Base.** This is the first time in the history of the country's armed forces that women gained their paratrooper's wings. **Air Force Commander Roshan Gunatilake** was the Chief Guest at the event.
**Pics** by **Pradeep K. Pathirana**



ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම වරට අපේ කාන්තාවන් 7 දෙනෙක් පැරචූට් මගින් ගුවනින් බිමට ආ අයුරුය මේ. ගුවන් හමුදාපති රොෂාන් ගුණතිලක ඔවුන් හමුවී කතා කරයි.

## ආබාධිත රණවිරුවන් සඳහාය කියා මුදල් එකතුකර අසුවේ

**හ**මුදාවෙන් පැන ගිය පුද්ගලයෙකු සම්පූර්ණ හමුදා නිල ඇඳුමෙන් සැරසී ආබාධිත රණවිරුවන්ගේ අරමුදල සඳහා ආධාර එකතුකරන බව පෙන්වමින් රුපියල් 50 හේ ටිකට් පත් කටුනායක නිදහස් වෙළඳ කලාප භූමියේ විකුණද්දී පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. එවෙලේ ඔහු ළඟ ව්‍යාජ හමුදා හැඳිනුම් පතක්ද තිබුණි.

මේ වංචනික පුද්ගලයාට උදව්කර ඇති ආබාධිත සොල්දාදුවෙකුද පොලීසිය සොයයි. අල්ලාගත් පුද්ගලයා පොලීසියට කළ පාපොච්චාරණයකදී කියා ඇත්තේ තමා ඒ වන විට රුපියල් ලක්ෂ කීපයක් ඒ උප්පරවැට්ටිය යොදා උපයා ඇති බවත්, එසේ කළේ ගෙයක් සාදාගැනීමට මුදල් සොයාගැනීමේ අදහසින් බවත් ය.

## පිස්සු බල්ලන් සපා කා වසරකට 50 ක් මිය යති

**ජ**ලභීතිකා හෙවත් පිස්සු බලු රෝගයෙන් වසරකට ලංකාවේ පුද්ගලයින් 50 දෙනෙකු මියයන බවත්, පිස්සු බල්ලන් සපාකෑමට 7,30000 පිරිසක් ලක්වන බවත් සෞඛ්‍ය අමාත්‍යංශය පෙන්නා දෙයි. ඔවුන්ට ප්‍රතිකාර කිරීමට රුපියල් මිලියන 500 කට වඩා වැයවන බව සෞඛ්‍ය අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා මේ නොබෝදා ලංකාවේ ඩේලිමිරර් පුවත්පතට පවසා ඇත.

## සෞදියෙන් නෙරපූ ලාංකිකයෝ 120 ක් අතේ සතේ නැතිව එති

### ගැහැණු 80 ක් හා පිරිමි 40 ක්

**වී**සා නොමැතිව අනවසරයෙන් සවුදි අරාබියාවේ රැඳී සිටීමේ චෝදනාව මත එරටින් පිටුවහල් කරනු ලැබූ ශ්‍රීලාංකික ගෘහ සේවක සේවිකාවෝ 120 ක් ගිය සතියේ දිවයිනට පැමිණියෝය. කාන්තාවෝ 80 ක් හා පිරිමි 40 දෙනෙක් මේ පිරිසට අයත් වූහ. සවුදි අරාබියේදී ප්‍රසූත කළ දරුවන් ද රැගෙන පැමිණි කාන්තාවෝ දෙදෙනෙක්ද ඒ පිරිසේ සිටියහ.

මේ පිරිස ශ්‍රීලංකාවට එවීමට කලින් සවුදි අරාබියේ වීසා නොමැති විදේශික ශ්‍රමිකයින්ගේ කඳවුරක රඳවනු ලැබ සිටියහ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු ආපසු ලංකාවට පැමිණියේ හිස් අතිනි. සිය නිවෙස් බලා යෑමට මග වියදම වත් ඔවුන් ළඟ තිබුණේ නැත. විදෙස් සේවා නියුක්ත කාර්යාංශයේ කළමනාකාර ශ්‍රී ලාල් පෙරේරා මහතා ඉදිරිපත්ව ඒ පිරිසට නිවෙස් බලායාමට මග වියදම් ගුවන් තොටුපළේ දී ලබාදෙන ලදී.

***කේ. එල්. කරුණාරත්න*** **Sri Lanka**

## ♥ පැටියො ඩාලිං



පැටියෝ..... මතකද අපේ නැබඩ ලොකු මාමගෙ පුතා පින්සිරිට සංගීතෙ ඉගෙන ගන්න ආසයි කිව්වම අපි ගිය අවුරුද්දෙ වයලින් එකක් ඇරියා..... මෙන්න මැන් අද ලියුමක් එවලා තියනවා..... අත්සන යටින් දාලා තියනවා සංගීත විශාරද කියලා....

## Sinhala Lesson 119 සිංහළ පාඩම

### සිංහල ඉගෙනීමට පහසු මගක් !

### The Present Participle - මිශ්‍ර ක්‍රියාව

Sometimes we want to say that the **Subject උක්තය** in a sentence is doing more than one action at the same time as the finite **Verb (ක්‍රියාව)** or final action. In English we usually join such parts of a sentence with link words such as '**and**','**while** ' as in the following examples:

**Father is sitting there writing a letter.**
**පියා ලියුමක් ලියමින් / ලියලිය එහි වාඩිවී සිටියි**

**Father is sitting there writing a letter while drinking tea.**
**පියා තේ බොමින් / බිබී ලියුමක් ලියමින් / ලියලිය එහි වාඩිවී සිටියි**

You will see that the words **ලියලිය / ලියමින්, බිබී බොමින්** are **Present Participles.** These are formed either by adding the suffix, **මින්** to the verb base. **බො+මින් = බොමින් ලිය+මින් = ලියමින්** or by duplicating the verb base **බො - බිබී ලියලිය**

**We will continue this with examples in the next lesson.**

**♦ ආචාර්‍ය සුභද්‍රා සිරිවර්ධන**
**Dr Subhadra Siriwardane - MA PhD London**

## හරස්පද ප්‍රහේලිකා 97

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | ■ | 4 |
| 5 | | | ■ | |
| 7 | ■ | 6 | 7 | |
| ■ | 8 | | | |
| 9 | | ■ | 10 | |

**හරහට :**
1 වේලර්ලා ළඟ ඇත.
5 ගෙවල්.
6 පැත්ත යන තේරුම ඇත.
8 හරකුන් මෙහි බැඳේ.
9 ඉතා කැමති
10 වැඩියෙන් මහත

**පහළට :**
1 වැඩිමල් ළමයා ළඟ කෙනා
2 මුහුණ පිසින දෑ.
3 උණ කටුවේ ඇති දියර
4 ගමේ ගොඩේ බාසාව
7 දුර්භික්ෂ
8 සර්පයින් තුළ මෙය තිබේ.

***ගියවර නිවැරදි විසඳුම්***
**හරහට:** 1 දෙකටන 4 බටු 5 දත 7 රවන 9 ගුදම 11 වසලයා
**පහළට:** 1 දෙබරවැව 2 කටුව 3 නද 6 තරම 8 නගුල 10 දයා

### නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

## විශේෂ බිත්තර කරියක්

## A SPECIAL EGG CURRY

***අවශ්‍ය ද්‍රව්‍ය :*** මධ්‍යම ප්‍රමාණයේ බිත්තර 6 ක්
උළුහාල් තේ හැඳි 1 ක්
සුදු ළූණු බික් 2 ක්
රතුළූණු ගෙඩි 5 ක්
අමුමිරිස් කරල් 2 ක්
මිටිකිරි හෝ ( Full-Cream Milk) කෝප්ප 2 ක්
මිරිස් කුඩු තේ හැඳි ½ ක්
බැදගත් තුනපහ තේ හැඳි 1 ක්
තෙල් ස්වල්පයක් හා දෙහි ස්වල්පයක්
ඉඟුරු කැබැල්ලක් හා කුරුඳු කැබැල්ලක්
කහ සහ ලුණු අවශ්‍ය පමණට
කරපිංචා සහ රම්පෙ

***සාදන ක්‍රමය :*** බිත්තර තම්බාගෙන කටු හැර ගැඹුරු තෙලේ රන්වන් පාට වනතුරු බැදගන්න. තවත් භාජනයකට තෙල් ස්වල්පයක් දමා රත් වූ විට, ඊට කුරුඳු, රම්පෙ, උළුහාල්, ලියාගත් රතුළූණු, අමු මිරිස්, තලාගත් ඉඟුරු කැබැල්ල ආදිය දමා බැදෙන්නට හරින්න. බැදී ගෙන එනවිට කහ, මිරිස්, තුනපහ කුඩු එකතුකරන්න. ඊට පසු කිරි දමා, ලුණු ද එකතුකර නොනවත්වාම හැඳිගාමින් හොද්ද උයාගන්න. බැද පසෙක තැබූ බිත්තර දෙකට පලා හොද්දට එකතු කර නොකැඩෙන්නට ප්‍රවේශමෙන් හැඳි ගාන්න. ලිපෙන් බා, දෙහි ඉස්ම මිශ්‍රකර යළිත් හැඳි ගා කෑම මේසයට යවන්න.

♥ ***අසෝකා කරුණාරත්න*** **Sri Lanka**


Sam's CHICKEN CHICKEN CHICKEN
Great Tasting! Great Value!
සැම්ස් චිකන්
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432